**2024.08.26**

**ADIC මාධ්‍ය නිවේදනය**

**<u>මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC), ජනාධිපති අපේක්ෂකයන්ට මද්‍යසාර, දුම්වැටි පාලනය සහ මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් යොමු කරන යෝජනා 12ක්</u>**

මද්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය නිසා ආර්ථිකමය, සෞඛ්‍යමය හා සමාජීයව ගැටලු රාශියකට රටක් වශයෙන් අපට මුහුණ දීමට සිදුවී ඇත. දුම්වැටි සහ මද්‍යසාර භාවිතයෙන් දිනකට පුද්ගලයන් 100කට ආසන්න ප්‍රමාණයක් අකාලයේ මරණයට පත් කරයි. ශ්‍රී ලංකාවේ සිදුවන වළක්වා ගත හැකි මරණවලින් 10න් 8කටම බෝ නොවන රෝග (NCD) හේතුවන අතර එම රෝග ඇති වීමට බලපාන ප්‍රධාන සාධක 4න් 2ක්ම දුම්වැටි සහ මද්‍යසාර භාවිතය හේතු වී ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ තොරතුරු වලින් අනාවරණය වී ඇත.

ශ්‍රී ලංකාවේ පුද්ගලයන් දිනකට දුම්වැටි සහ මද්‍යසාර භාවිතය සඳහා රුපියල් කෝටි 121 ක් වියදම් කරයි. දුම්වැටි සහ මද්‍යසාර භාවිතය රටකට තව දුරටත් ආදායමක් නොවන අතර 2022 වර්ෂය තුළ සුරාබදු වශයෙන් රුපියල් බිලියන 165 බදු ප්‍රමාණයක් අයකර ගනු ලැබුවත් මද්‍යසාර භාවිතය නිසා එම වසරේ රටට සෞඛ්‍ය සහ ආර්ථික වශයෙන් ඇති වූ පිරිවැය රුපියල් බිලියන 237 ක් වේ. (Source - Investment Case For Alcohol Control In Sri Lanka 2022- UNDP)

එමෙන්ම 2016 වර්ෂය තුළ රජය සිගරට් බදු වශයෙන් රුපියල් බිලියන 88 ක් අයකර ගනු ලැබුවත් සිගරට් භාවිතය නිසා සිදු වූ සෞඛ්‍යය සහ ආර්ථික පිරිවැය රුපියල් බිලියන 214 බව අධ්‍යයන වලින් අනාවරණය වී ඇත. (Source - Investment Case for Tobacco Control in Sri Lanka 2019, UNDP )

එබැවින් මද්‍යසාර, සිගරට් සහ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය ආර්ථිකමය, සෞඛ්‍යයමය හා සමාජීයව ගැටලු රැසක් ඇති කිරීමට බලපානු ලබයි. නිවැරදි ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම මගින් මෙම ගැටලු පාලනය කිරීමට රජයට හැකියාවක් ඇත.

මෙරට 9 වන විධායක ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම වෙනුවෙන් පැවැත්වෙන ජනාධිපතිවරණය සැප්තැම්බර් 21 වන දින පැවැත්වීමට නියමිතව ඇත. ඒ අනුව සෑම ජනාධිපති අපේක්ෂකයෙකුම ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කරන අතර, ඒ තුළ ඇතුළත් කිරීමට යෝජනා කරන රටේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් රට තුළ දුම්කොළ, මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක සිට කටයුතු කරන අප ආයතනය (මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය) විසින් සකස් කර ඇති නිදෙර්ශ පහත පරිදි වේ. මේ පිළිබඳව දිගුවක් සෑම අපේක්ෂකයෙකුටම ලබා දී ඇත.

**<u>දුම්වැටි, මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය ගැටලු පාලනයට යෝජනා හා නිදෙර්ශ</u>**

**01.** **මද්‍යසාර සහ දුම්වැටි සඳහා වූ බදු උද්ධමනයට සහ ආර්ථික වර්ධනයට ගලපමින් සෑම වසරකම සුරාබදු වැඩි වන විද්‍යාත්මක බදු සූත්‍රයක් හඳුන්වා දෙමින් එය ක්‍රියාත්මක කිරීම.**

**02.** **දුම්කොළ සහ මද්‍යසාර සමාගම් දැනටමත් රජයට ගෙවිය යුතු නමුත් පැහැර හැර ඇති බදු අයකර ගැනීමටත් අනාගතයේ එවැනි තත්වයක් ඇති නොවීමටත් ක්‍රමවත් බදු අය කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.**

**03.** **මද්‍යසාර සහ දුම්කොළ භාවිතය හා ප්‍රවර්ධනය අවම කිරීමට දැනට සම්මතකර ඇති නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මෙන්ම දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනතට යෝජනා කර ඇති සංශෝධන කඩිනමින් සම්මත කර ගැනීම.**

I. ඒකල වශයෙන් (සිගරට් එක දෙක ලෙසින්) සිගරට් අලෙවිය තහනම් කිරීමේ සශෝධනය ක්‍රියාත්මක කිරීම.

II. අධ්‍යාපන ආයතනයක හෝ ආගමික ස්ථානයක සිට මීටර 100ක් ඇතුළත දුම්වැටි සහ මද්‍යසාර අලෙවි කරන ස්ථානයක් පවත්වා ගෙන යාම තහනම් කිරීමේ සංශෝධනය ක්‍රියාත්මක කිරීම.

III. සියලුම පොදු ස්ථාන දුම්වැටි සහ මද්‍යසාර භාවිතයෙන් තොර කලාප බවට පත් කිරීමේ සංශෝධනය ක්‍රියාත්මක කිරීම.

IV. අන්තර්ජාලය ඇතුලු සියලු මාධ්‍ය තුළින් දුම්වැටි, මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය දිරිගන්වන ගීත, ගීත ඇල්බම්, චිත්‍රපට, ටෙලිනාට්‍ය, යූ ටියුබ්, ෆේස් බුක්, වීඩියෝ සංවාද ආදී සියලු ආකාරයේ ප්‍රවර්ධනයන් වැළැක්වීම සඳහා වූ සංශෝධනය ක්‍රියාත්මක කිරීම.

V. අන්තර්ජාලය හරහා සියලු ආකාරයේ දුම්වැටි, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය අලෙවිය තහනම් කිරීමේ සශෝධනය ක්‍රියාත්මක කිරීම.

VI. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනතට අදාළ වැරදි අත්අඩංගුවට ගත හැකි වරදවල් බවට පත් කිරීම සහ එම වැරදි වලට පනවන දඩ මුදල් සහ දඬුවම් කාලය වැඩි කිරීමේ සශෝධන ක්‍රියාත්මක කිරීම.

VII. නීතියෙන් තහනම් කර ඇති දුම්රහිත දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සහ නීත්‍යානුකූල නොවන මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය අලෙවියට අදාළව නීතිය ක්‍රියාත්මක වීම.

VIII. දුම්කොළ සහ මද්‍යසාර සමාගම්වල අනුග්‍රාහ දැක්වීම් තහනම් නමුත් එය තවදුරටත් උල්ලංඝනය කිරීම් සිදුවෙමින් පවතී. එය වැළැක්වීම සඳහා කටයුතු කිරීම.

IX. ප්‍රධාන මාධ්‍ය හා සමාජ මාධ්‍ය හරහා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන අලෙවියට අදාළව ඍජු හා වක්‍රාකාර ප්‍රචාරණය සිදු කිරීම නැවැත්වීමට කටයුතු කිරීම.

**04.** **තාවකාලික මද්‍යසාර බලපත් නිකුත් නොකිරීම සහ සංචාරක කර්මාන්තය මුවාවෙන් නිකුත් නරන සුරා බලපත් ලබා දීමේ ක්‍රමවේදය අත් සිටුවීම.**

**05.** **2016 අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම.**

**06.** **නීති විරෝධී මද්‍යසාර, දුම්වැටි සහ අනෙකුත් මත්ද්‍රව්‍ය පාලනය සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම. ඒ සඳහා ඇති ආයතන ශක්තිමත් කිරීමට ක්‍රියාත්මක වීම.**

**07.** **මත්ද්‍රව්‍ය භාවිතයට පුරුදු වීමට පෙර එයින් වළක්වා ගැනීමේ අරමුණෙන්, ළමුන් සහ තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් දිගින් දිගටම ක්‍රියාත්මක වන ප්‍රතිඵලදායක දුම්වැටි, මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අධෛර්යමත් කිරීම සඳහා ජාතික මට්ටමේ නිවාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.**

**08.** **මද්‍යසාර භාවිතය සඳහා යොමු වූවන් එයින් නිදහස් කරගැනීමට උපදේශනය, ප්‍රතිකාර හා වෙනත් සේවා සහ අවශ්‍ය වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සහ දුම්වැටි සහ මද්‍යසාර භාවිතයෙන් නිදහස් වීමට උදවු ලබාගත හැකි “1948” දුරකතන උපදේශන සේවාව ( Quit Line ) තවදුරටත් පුළුල්කර ක්‍රියාත්මක කිරීම.**

**09.** **දුම්කොළ පාලනය සඳහා වන ජාත්‍යන්තර මට්ටමේ සම්මුතියක් වන WHO Framework Convention on Tobacco Control (FCTC) අප රට අත්සන් තබා ඇති අතර එහි ඉලක්ක නිශ්චිත කාල රාමුවකට අනුව අවසන් කිරීම.**

**10.** **දුම්වැටි සහ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ බලපත්‍ර නොමැතිව දුම්වැටි සහ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය තහනම් කිරීම.**

**11.** **දුම්කොළ සහ මද්‍යසාර කමර්ාන්ත විසින් දැනට පවතින ප්‍රතිපත්ති දුවර්ල කිරීමට සහ නව ප්‍රතිපත්ති ගෙන ඒම වළක්වමින් සිදුකරන මැදිහත්වීම් වැළැක්වීමට කටයුතු කිරීම.**

**12.** **ගංජා නීතිගත කිරීමේ උගුලෙන් රට ගලවා ගැනීමට ගංජා භාවිතයේ ඇති හානිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ ගංජා භාවිතය ප්‍රවර්ධනය කරන විවිධ ආකාරයේ මාධ්‍යයට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය නව පනත් සම්මත කිරීම සහ බලාත්මක කිරීම.**

මෙම නිදෙර්ශ ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ගැටලුව අවම කිරීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම සහ අපේ රටේ පුරවැසියන්ගේ යහ පැවැත්ම සහතික කිරීම අරමුණු කරගෙන සකස් කර ඇත. මෙම නිදෙර්ශ සඳහා ඉදිරි ජනාධිපති අපේක්ෂකයන් ඒ සඳහා ඔවුන්ගේ එකඟතාවය සහ එය ඔවුනගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇතැයි මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC ආයතනය) බලාපොරොත්තු වේ.

මෙම වැඩපිළිවෙළට ලබා දෙන සහයෝගය සහ නායකත්වය යටතේ සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා සෞඛ්‍ය සම්පන්න නිදහසින්, සතුටින් ජීවත් වීමට හැකි පරිසරයක් නිමර්ාණය කර දීම අනාගත ජනාධිපතිවරයාගේ වගකීම බව මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC ආයතනය) ලෙස අප තරයේ අවධාරණය කර සිටිමු.

**මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC ආයතනය)**